Article 11

(87)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2021-11-17

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | එච්.එම්.එම්.ජී.එච්. විමලවීර මයා,<br>අංක - 75/1, කෑගල්ල පාර,<br>බුලත්කොහුපිටිය. |
| වගඋත්තරකරුවන් | : | 1. ස්ථානාධිපති,<br>පොලිස් ස්ථානය,<br>බුලත්කොහුපිටිය.<br><br>2. පො.කො 8600 ප්‍රේමචන්ද්‍ර මයා,<br>පොලිස් ස්ථානය,<br>බුලත්කොහුපිටිය. |

<u>පැමිණිලි අංකය : **HRC/K/655/16**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2013.11.03 වන දින පොලිස් නිලධාරීන් තම නිවසට පැමිණ උසාවි නියෝගයක් අනුව බව පවසා තමාගේ ගල්, වැලි, කම්බි, සැටලිම සහ සිමෙන්ති ඇතුළු රුපියල් ලක්ෂයකට ආසන්න ද්‍රව්‍ය පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවයි. එම හේතුවෙන් තමා ණය බරින් පීඩා විඳින බවත්, එසේම පොලිස් ස්ථානාධිපතිගේ අණපරිදි අසල්වාසීන් එක්ව රතිඤ්ඤා පත්තු කරමින් හූ කියමින් තමාට සහ තම පවුලේ අයවලුන් ලැජ්ජාවට පත්කළ බවත්, ඉන් පසුද ස්ථානාධිපති විසින් අසල්වැසි නිවසකට ගල්ගැසීමේ චෝදනාවක් ඉදිරිපත් කරමින් තමාව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ බවත්ය. අධිකරණයෙන් තමා ඇප මත නිදහස් කළද අධිකරණයේ කිසිදු විමර්ශනයකට ලක් කිරීමක් සිදු නොකළ බවත් දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் — 011-2505451
ෆැක්ස් / தொலைநகல் — 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் — sechrcsl@gmail.com

එසේම තම ත්‍රීරෝද රථය ගරාජය වෙත ගෙන යාම සඳහා පොලිස් ස්ථානය ඉදිරිපිට ඇති තම නිවස ඉදිරිපස නවතා නිවස තුළ සිටින අවස්ථාවේදී ත්‍රීරෝද රථය පොලීසිය වෙත ගෙන ගොස් ඇති බවත්, ඒ පිළිබඳව විමසීමට අවස්ථා 11 කදී පමණ පොලිස් ස්ථානයට යාමට සිදුවූ බවත්, එම අවස්ථාවන්හිදී පොලිස් නිලධාරීන් ඉතා සැරපරුෂ අන්දමින් තමාට බැනවැදුනු බවත්, ත්‍රීරෝද රථය අත්අඩංගුවට ගැනීමට හේතුව ලෙස එය ධාවනය කිරීම සඳහා තහනම් නියෝගයක් ඇති බවට පවසන ලද බවත්, පසුව කෑගල්ල අධිකරණයේ තමාට විරුද්ධව නඩුවක් පවරා ත්‍රීරෝද රථය භාරගන්නා ලෙසට දන්වමින් ස්ථානාධිපති විසින් තමාට තැපැල් මඟින් ලිපියක් යොමුකර තිබූ බවත් සඳහන් කර ඇත.

තවද 2016.11.25 දින තමා රජයේ කොන්ත්‍රාත් වැඩ සඳහා අවශ්‍ය ද්‍රව්‍යයන් මිළදී ගැනීමට තම ලොරි රථයෙන් වෙළඳසැල වෙත ගිය අවස්ථාවේදී බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ නිලධාරියෙක් පැමිණ තමාගේ වාහනයේ රියදුරු බලපත්‍රය හා ආදායම් බලපත්‍රය ඉල්ලූ අතර තමා ඒවා ලොරියේ ඇති බවට පැවසූ බවත්, පසුව එම ස්ථානයෙන් පිටත්වීමට සූදානම් වන අවස්ථාවේදී පොලිස් නිලධාරියා පැමිණ තමාගේ කණට පහරක් එල්ල කර තම දකුණු අත ලොරියේ දොරට සිරකර තමාට දරුණු ලෙස පහරදුන් අතර, ඒ හේතුවෙන් දකුණු අතෙහි ඇටකටු 03 ක් බිඳී ඇති බවත්, ඒ බව පැමිණිලි කිරිමට පොලිස් ස්ථානයට ගියද පැමිණිල්ල භාරගැනීමට ස්ථානාධිපති පැමිණෙන තෙක් සිටින ලෙස පැවසූ බවත්, පහරදීම හේතුවෙන් තමා අපහසුවෙන් සිටි බැවින් පැය භාගයක් පමණ රැඳී සිට එතැනින් පිටත්ව රෝහල්ගතවූ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, බුලත්කොහුපිටිය පොලිස් ස්ථානය වෙත පවරා ඇති ඉඩම් කොටසක් පැමිණිලිකරු තමාට අයත් යැයි පවසා නීති විරෝධී අනවසර ඉදිකිරීමක් සිදුකරන අවස්ථාවේදී එවකට සිටි ස්ථානාධිපති විසින් මේ පිළිබඳව අධිකරණයට කරුණු වාර්තා කර ඇති අතර, ඊට අදාළ ගොනුව නීතිපති වෙත යොමුකර ඇති බවයි.

තවද 2016.08.29 වන දින පො.කො මහේෂ් සහ පො.කො ප්‍රේමචන්ද්‍ර යන අය බුලත්කොහුපිටිය නගරයේ රථවාහන පාලන රාජකාරියේ යෙදී සිටියදී JGGL-6822 දරණ ත්‍රීරෝධ රථය අධික ශබ්දයක් නිකුත් කරමින් ධාවනය කරමින් සිටියදී එය නවතා රථයේ ලියකියවිලි සහ රියදුරු බලපත්‍රය ඉල්ලා සිටි බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකරුගේ පුත්‍රයා විසින් ත්‍රීරෝද රථය පදවාගෙන පැමිණි බවත්, ඔහු වාහනයේ ලියකියවිලි හා ආදායම් බලපත්‍ර රැගෙන ඒමට නිවසට ගියද ඔහු නැවත නොපැමිණීම හේතුවෙන් ත්‍රීරෝද

රථය පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත්, එය කෑගල්ල මෝටර් රථ වාහන පරීක්ෂක විසින් පරික්ෂා කර දෝෂ පෙන්වා දී ඒවා සාදා ඉදිරිපත් කරන ලෙසට තහනම් නියෝගයක් ලබාදුන් බවත්, එහිදී පැමිණිලිකරුට ත්‍රීරෝද රථයේ ලියකියවිලි සහ එය පැදවූ අයගේ රියදුරු බලපත්‍රය ඉදිරිපත් කරන ලෙස දැන්වූවද මෙතෙක් ඒවා ඉදිරිපත් කර නොමැති බවත්, කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණය ත්‍රීරෝද රථයේ දෝෂ නිවැරදි කර ඉදිරිපත් කිරීම නිසා එය මුදා හැරි බවත් සඳහන් කර ඇත.

එසේම 2016.11.23 වන දින සති පොළ පැවැත්වූ දිනයක් වූ අතර, පැමිණිලිකරුගේ ලොරි රථය වාහන ගමනාගමනයට අවහිර වන පරිදි නවතා තිබූ බවත්, පො.කො ප්‍රේමචන්ද්‍ර සහ පො.කො නිලන්ත යන නිලධාරීන් පැමිණිලිකරුට වාහනය ඉවත් කර ගන්නා ලෙසට පවසා රියදුරු බලපත්‍රය ඉල්ලූ විට පැමිණිලිකරු බැණවදිමින් වේගයෙන් ලොරිය ඉදිරියට ගැනීම හේතුවෙන් ලොරි රථය පො.කො ප්‍රේමචන්ද්‍ර යන අයගේ කකුලක වැදී ප්‍රතිකාර සඳහා ඔහුව කෑගල්ල මූලික රෝහලට ඇතුළු කළ බවත් ප්‍රකාශ කර ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු මූලිකවම කොමිෂන් සභාවේ අවධානය යොමුකර ඇත්තේ, වගඋත්තර පාර්ශවීය පොලිස් ස්ථානාධිපති ඇතුළු පොලිස් නිලධාරීන් වරින් වර තමාට ව්‍යාජ චෝදනා ඉදිරිපත් කරමින් නඩු පැවරීම, මූල්‍යමය පාඩු සිදුකරමින් තමාට ඉතා දරුණු ලෙස පහරදී කායික මෙන්ම මානසික පීඩාවන්ට පත්කිරීම සිදුකරන ලද බවයි.

ඒ අනුව පැමිණිල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේදී අදාළ පහරදීම සම්බන්ධයෙන් පැමිණිලිකරු පවසා ඇත්තේ, සමාධි හාඩ්වෙයාර් ඉදිරිපසදී පො.කො ප්‍රේමචන්ද්‍ර නිලධාරියා තමාට තර්ජණය කර ලොරි රථයේ දොර ඇර තමාගේ අත අඹරා ලොරියෙන් බිමට ඇද දමා පහරදී පිස්තෝලය හිසට තබා තර්ජණය කරන ලද බවයි. වගඋත්තර පොලිස් නිලධාරියා පවසා ඇත්තේ පැමිණිලිකරුගේ ලොරිරථය මාර්ගය අවහිර වන පරිදි නවතා තිබූ නිසා ඔහුට එය ඉවත් කර ගන්නා ලෙස පැවසූ විට ඔහු තමාට බැනවැදී ලොරි රථය තමාගේ කකුලේ වදින ලෙස පදවාගෙන ඉවත්ව ගිය බවයි.

අදාළ පහරදීම සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් බුලත්කොහුපිටිය රජමහා විහාරයේ විහාරාධිපති දොඹේපොල ශ්‍රී සීලාලංකාර හිමියන් සඳහන් කර ඇත්තේ, වගඋත්තරකාර පොලිස් නිලධාරියා පැමිණිලිකරුට කළ පහරදීම හා තර්ජණය තමා දුටු බවයි.

(ආ)

අධිකරණ වෛද්‍ය වාර්තාව :-

පැමිණිලිකරුට කර ඇති පහරදීම සනාථ කිරීම සඳහා අධිකරණ වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කර ඇති අතර, අදාළ වෛද්‍ය වාර්තාවේ පැමිණිලිකරු 2016.11.19 වන දින රෝහල්ගත වී 2016.11.21 වන දින රෝහලෙන් පිටත්ව ගොස් ඇති බවට දැක්වේ.

පැමිණිලිකරුගේ දකුණු අත ඇඹරීමකට හා පහරකෑමක් නිසා ආබාධයකට ලක්වී ඇති අතර, අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල වල විස්තරය හා එය සැසඳේ. ඒ අනුව දකුණු උරහිසේ සන්ධි විතැන්වීමක් හා සෙ.මී ½×½ ප්‍රමාණයේ ඉරීමක් උඩුතොල්පටට වම් පසින් ඇති බවට සඳහන් කර ඇත. එහිදී සන්ධි විතැන්වීම බරපතල තත්වයේ තුවාල ගණයේ පවතින බවට දක්වා ඇති අතර, ඉහත සඳහන් කළ තුවාල පහරදීමක් නිසා ඇති වී තිබෙන බව වෛද්‍යවරයාගේ මතය වී ඇත.

ඒ අනුව තුවාල සිදුකල ආකාරය සහ සිදු වී ඇති තුවාල සැසඳෙන බව නිරීක්ෂණය වේ. එසේම එම පහරදීම පිළිබඳ ඇසින් දුටු සාක්ෂියක් වූ බුලත්කොහුපිටිය රජ මහා විහාරයේ විහාරාධිපති ස්වාමින් වහන්සේ විසින් ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශය මගින් සනාථ වේ.

තවද, පැමිණිලිකරු සම්බන්ධව පොලිස් නිලධාරින් අත්තනෝමතිකව කටයුතු කර ඇති බව සමස්ත කරුණු අනුව නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට පහරදීම හා වධහිංසාවට ලක්කිරීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වන අතර, ඒ තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති "කෲර අමානුෂික දඬුවමකට හෝ අවමන් සහගත සැළකිල්ලකට භාජනය නොවීමේ" මූලික අයිතිවාසිකම වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. වගඋත්තරකාර පො.කො 8600 ප්‍රේමචන්ද්‍ර යන අය විසින් පැමිණිලිකරු වෙත රු. 10,000/-ක මුදලක් ගෙවීමට කටයුතු කළ යුතුය.

02. එසේම වගඋත්තරකරුගේ මෙකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමුකරනු ලැබේ.

2021.12 .17 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

සැ.යු :- **අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.**

B/-